# 12 සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන

මේ සඳහා ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධාන දෙකකි;

1. පූජකවරය : ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ අපෝස්තුලුවරුන්ට පැවරූ දූත සේවාව අඛණ්ඩ ව ලෝකය අවසානය දක්වා පවත්වා ගෙන යාමට ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධානය යි.

2. ආශිර්වාදකාර බන්ධනය : ආශිර්වාදකාර බන්ධනය පුරුෂයකු හා ස්ත්‍රියක අතර ජීවිතාන්තය දක්වා පවතින ගිවිසුමකි. දෙදෙනා අන්‍යෝන්‍ය වශයෙන් සහාය වෙමින්, ප්‍රේමය තුළ පරිපූර්ණත්වයට පත්වේ. ඔවුන් දරුවන් බිහිකර, ගුණ ගරුක දරුවන් ලෙස ඔවුන් ව හදා වඩා ගනියි.

මේ දේව ප්‍රසාද නිධාන දෙකෙන් ම දේව ජනතාව ගොඩනැගෙයි. පූජකවරු මීසම තුළ ද දෙමාපියෝ නිවස තුළ ද යහපත් පරිසරයක් ගොඩනගමින් තමන් පූජකවරය හෝ ආශිර්වාදකාර බන්ධනය හෝ ලැබූ දින කැප වූ සේවාව කර ගෙන යති.

## පූජකවරය



12.1 රූපය - දිව්‍ය පූජාව පැවැත්වීම

ජේසුස් වහන්සේ මහා බ්‍රහස්පතින්ද දින පහත සඳහන් වචන කියමින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නමැති දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කළ සේක.

උන් වහන්සේ රොටී ගෙන තුතිපුදා ඒවා කඩා, ඔවුන්ට දී "ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය" මා සිහි කිරීම පිණිස මෙය කරන්නැ" යි වදාළ සේක.

(ලූක් 22:19)

පූජාප්‍රසාදීන් වහන්සේලා දිව්‍ය පූජාව පවත්වමින් අන්තිම රාත්‍රි භෝජනයේ දී ජේසුස් වහන්සේ ස්ථාපිත කළ එම දේව ප්‍රසාද නිධානය අඛණ්ඩ ව සිහි කරති. තව ද පූජකවරය මගින් ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් වේ. එම නිසා මෙම දේව ප්‍රසාද නිධානය ලබා ගත හැක්කේ එක් වරක් පමණි.

## පූජාප්‍රසාදිතුමන්ලාගේ සේවාවන්

- ★ සුවිශේෂය දේශනා කිරීම
- ★ සැබෑ එඬේරකු වීම
- ★ දිව්‍ය පූජා පැවැත්වීම
- ★ දේව ප්‍රසාද නිධාන දානය කිරීම
- ★ දෙවියන් වහන්සේ හා ජනතාව අතර මැදිහත්කරුවකු වීම
- ★ දේව ජනතාව දෙවියන් වහන්සේ වෙතට රැගෙන යාම
- ★ මීසම් ජනතාවට අවශ්‍ය ආත්මික උපකාර ලබා දීම
- ★ ජනතාව ආසිරි ගැන්වීම
- ★ දහම් පාසල් පවත්වා ගෙන යාම
- ★ දහම ඉගැන්වීම
- ★ අවමංගල්‍ය පිළිවෙත් පැවැත්වීම
- ★ නිවෙස් සහ පවුල් බැහැදැකීම
- ★ දිළිඳුනට උදව් උපකාර කිරීම.

මෙලෙස අපට සහාය වන පූජාප්‍රසාදිතුමන්ලාගේ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා එතුමන්ලාට සහාය වීම කිතුනු දරුවන් වන අපගේ යුතුකමකි. ඒ නිසා අපි සැම, එතුමන්ලාගේ සේවයට සහාය වෙමු. පහත පින්තූරවලින් එවැනි අවස්ථා කිහිපයක් දැකිය හැකි ය.



12.2 රූපය - පූජාවට උදව්වන දරුවකු ලෙස



12.3 රූපය - දේව ප්‍රකාශන/විශ්වාසකයින්ගේ යැදුම් වැනි දෑ කියවමින්



12.4 රූපය - ගීතිකා කණ්ඩායමට එක් වී



12.5 රූපය - දේවස්ථානය ශුද්ධ පවිත්‍ර කරමින්

## ආශිර්වාදකාර බන්ධනය



12.6 රූපය - අශිර්වාදකාර බන්ධනය සිදු කරන අවස්ථාවක්

### ආශිර්වාදකාර බන්ධනය ස්ථාපිත කිරීම

දෙවියන් වහන්සේ විසින් ආරම්භ කළ විවාහය, ජේසුස් වහන්සේ දේව ප්‍රසාද නිධානයක තත්ත්වයට උසස් කළ සේක.

දෙවි සමිඳාණන් වහන්සේ කතා කොට, "මිනිසා තනි ව විසීම සුදුසු නැත; ඔහුට සුදුසු සහකාරියක මවා දෙන්නෙමි" යි වදාළ සේක.

උත්පත්ති 2:18

එහෙත්, මැවීමේ මුල සිට ම දෙවියන් වහන්සේ ඔවුන් ස්ත්‍රී පුරුෂ වශයෙන් මැවූ සේක. ඒ හේතුකොට ගෙන මිනිසෙක් තම පියා ද මව ද අතහැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ යුවළ ද එක ම මාංසයක් වෙති. මෙසේ ඔව්හු එවක් පටන් දෙදෙනෙක් නොව එක් කෙනෙක් වන්නෝ ය. එබැවින් දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේ වා!" යි වදාළ සේක.

මාක් 10:6-9

## දෙමව්පියන් වෙනුවෙන් දරුවන්ගේ යුතුකම් හා වගකීම්

| | |
|---|---|
| උපදේශකයා 3:12-16 | • පියාගේ මහලු වියේ දී ආධාර කරන්න<br>• පියාගේ සිතට වේදනා නොදෙන්න<br>• කල්පනා ශක්තිය අඩු වුව ද පියාට අනුකම්පා කරන්න<br>• පියා ව අත් නොහරින්න<br>• මව කෝප නොකරන්න |
| උපදේශකයා 7:27-28 | • මුළු සිතින් පියාට ගෞරව කරන්න<br>• මව විඳි ප්‍රසව වේදනාව කිසි දිනෙක අමතක නොකරන්න<br>• දෙමාපියන් ඔබ මෙලොවට බිහි කළ බව අමතක නොකරන්න |
| කොලොස්සි 3:20 | • සියලු කාරණාවල දී දෙමාපියන්ට කීකරු වන්න |
| එපිස 6:1-2 ට | • දෙමාපියන්ට කීකරු වන්න<br>• ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න |



12.7 රූපය - දෙමාපියන් නැමදීම

මෙම චිත්‍රය දෙස බලන්න. තම දෙමාපියන්ගේ දෙපා නමදින දරුවන් දෙදෙනකු ඔබට දැකිය හැකි ය. එලෙස අපිත් නොපැකිළ ව අපගේ දෙමාපියන්ගේ දෙපා නැමදිය යුත්තෙමු. එමෙන් ම අප වෙනුවෙන් දිවි කැප කරන ඔවුනට අප සහාය විය යුතු ය. ශිෂ්‍යයින් ලෙස අපගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගනිමින්, ඔවුන් සතුටු කළ යුතු ය. නිතර ම ගෙදර සාමය ඇති කරන ආකාරයේ ක්‍රියාවල නිරත විය යුතු ය. මන්ද ඔවුහු අපට ජීවිතය ලබා දී අප පෝෂණය කරති. අපට අධ්‍යාපනය ලබා දෙති. අපගේ ආධ්‍යාත්මික කටයුතු පිළිබඳ ව සොයා බලති. අප උනන්දු කරවති.

**ක්‍රියාකාරකම**

1. පූජකවරය ස්ථාපිත කිරීම හා පූජකතුමන්ලාගේ සේවාවන් ඇතුළත් වාර්තාවක් සකසන්න.
2. පවුල තුළ දරුවන්ගේ යුතුකම් හා වගකීම් කිහිපයක් නිර්මාණාත්මක ව පෝස්ටරයකින් ඉදිරිපත් කරන්න.

***ජීවිතයට බිඳක්***

*දෙමාපියන්ට හා මීසමේ පියතුමන්ට කීකරු වන්න.*